## WEATHER FORECAST FOR 03rd OCTOBER 2018
## (Issued at 05.30 a.m. on 03rd October 2018)

**Inter-monsoon conditions have established over the country.**
**Due to the low level atmospheric disturbance in the vicinity of Sri Lanka, prevailing showery condition is expected to continue over the island during next few days.**

Showers or thundershowers will occur in the most parts of the island after 2.00 p.m.
Very heavy falls about 150 mm can be expected at some places in the North-Central, Central and Uva provinces. Heavy falls about 100 mm can be expected at some places elsewhere in the island.
Showers or thundershowers may occur at several places in coastal areas in the morning too.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

**අන්තර් මෝසම් කාලගුණ තත්ත්වය දිවයින හරහා ස්ථාපිතව ඇත.**
**ශ්‍රී ලංකාව ආසන්න පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් දිවයිනේ පවතින වැසි තත්ත්වය ඉදිරි දින කිහිපයේදී තවදුරටත් පවතිනු ඇත.**

දිවයින පුරා බොහෝ ප්‍රදේශවල සවස 2.00න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.
උතුරු-මැද, මධ්‍යම සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවලට මි.මී. 150 ක පමණ ඉතා තද වැසි ඇති විය හැකි අතර දිවයිනේ සෙසු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තද වැසි ඇති විය හැක.
වෙරළබඩ ප්‍රදේශවල තැනින් තැන උදෑසන කාලයේදීත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 03rd October 2018)

Showers or thundershowers will occur at the Western and Southern sea areas of the island and heavy showers can be expected at some places.
Showers or thundershowers will occur at several places in the other sea areas around the island in the evening or night.

Winds will be variable in direction in the sea areas around the island and wind speed will be 15-20 kmph.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
## 2018 ඔක්තෝබර් මස 03 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

දිවයිනට බස්නාහිර සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර ඇතැම් ස්ථාන වලට තද වැසි ද ඇති විය හැක.
දිවයින වටා සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිශ්චිත දිශාවකින් තොරව හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 15-20 පමණ වේ.
**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.**

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/10/03
Time : 0540 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

# අන්තර් මෝසම් කාලයේ කාලගුණ තත්වය

දිවයින හරහා අන්තර් මෝසම් කාලගුණ තත්වය ස්ථාපනය වී ඇති අතර එහි ප්‍රධානම ලක්ෂණය වන්නේ සවස් කාලයේ ඇතිවන අකුණු සහ ගිගුරුම් සහිත වැසිය.

දහවල් කාලයේ හොඳින් හිරුරැස් වැටීම නිසා පොලොව අසල වාතය රත් වී ඉහලට ගමන් කරයි. එවිට ජලවාෂ්ප තිබේ නම් ඒවා ජල බිංදු බවට පත් වී වලාකුළු සෑදේ. සුළං ප්‍රවාහය දුර්වල නිසා මෙම වලාකුළු ඉතා උසට වර්ධනය වන අතර එමඟින් සවස් කාලයේ වැසි ලබාදෙයි. මෙම ක්‍රියාවලිය "සංවහනය" ලෙස හඳුන් වන අතර සංවහන වැසි සාමාන්‍යයෙන් විනාඩි 30-45ක් පමණ පවතී. ඉහත ඉහලට වර්ධනය වූ වලාකුළු "කැටි වැහි වලාකුළු " ලෙස හඳුන්වන අතර මෙම වලාකුළු අකුණු ඇති කරයි .තවද වළාකුලේ සිට පහලට ගලා එන සිසිල් සුළං ප්‍රවාහය නිසා ගස්වල අතු කඩාවැටීම් සහ වහලවල් ගැල වී යාම් සිදුවිය හැක. මෙම සුළං කිසි සේත්ම සුළි කුණාටු නොවන අතර වැසි ඇතිවන කාලය තුල එම ප්‍රදේශයට පමණක් සීමා වුවකි. පහලට ගලා එන සුළං ප්‍රවාහය කැරකීමට පටන් ගැනීම නිසා ඉතා කලාතුරකින් " ටොර්නැඩෝ "තත්වයක් ද ඇතිවිය හැක. එය සුළං වේගයෙන් කැරකෙන පුනීලයක් හැඩය ගත් පද්ධතියකි. එමඟින් සිදුවන හානිය වැඩිවන අතර අපේ රටේ එතරම් ප්‍රබල ටොර්නැඩෝ තත්වයන් ඇති නොවේ. ටොර්නැඩෝ මඟින් පොලොවේ ඇති ජලය හා කුඩා ජීවීන් ඉහලට ඇදී ගොස් නැවත වැටිය හැකිය. වළාකුලේ ඇති අයිස් කුට්ටි පහලට එන විට දිය වී ජල බිංදු වශයෙන් වර්ෂාව ඇති වුවද සමහර විට එසේ නොවී අයිස් කැට පොළොවට ලඟාවිය හැකිය.

වායුගෝලයේ කැළඹිලි ස්වභාවයන් ඉදිරි කාලයේ දී ඇතිවිය හැකිය. එවිට වැසි ඇතිවන්නේ සවස් කාලයේ පමණක් නොවේ. දවසේ ඕනෑම වෙලාවක වැසි ඇතිවන අතර පද්ධතියේ තීව්‍රතාව අනුව සුළං වේගය වෙනස් වේ. මෙම කාලය තුල සුළි කුණාටු වර්ධනය වීමට ද ඉඩ ඇත.

උතුරු අර්ධ ගෝලයේ සිට සහ දකුණු අර්ධ ගෝලයේ සිට හමා එන සුළං හමුවන ප්‍රදේශය අන්තර් නිවර්තන අභිසාරී කලාපය ලෙස හැඳින්වෙන අතර එම ප්‍රදේශයේද "කැටි වැහි වලාකුළු "වර්ධනය වේ. එවිට ද ගිඟුරුම් සහිත වැසි ප්‍රමාණය වැඩි වේ. අන්තර් මෝසම් කාලයේ සවස් කාලයේ සහ රාත්‍රී කාලයේ ගිඟුරුම් සහිත වැසි වැඩිපුර ලැබෙන්නේ ශ්‍රී ලංකාවට එම කලාපයේ බලපෑම් ඇති බැවිනි .
මෙම ගිගුරුම් සහිත වැසි සමග අකුණු සමග විදුලිය කෙටීම් මෙන්ම කෙටිකාලීන තද සුළං (යටි සුළං පහර /ටොර්නාඩෝ ) ඇති විය හැක.

අකුණු සහ ගිගුරුම් සහිත වැසි ඇතිවන අවස්ථා වලදී අකුණු අනතුරු වලින් ආරක්ෂා වීම සඳහා පහත උපදෙස් පිලිපදින ලෙස මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ .

**1. කුඹුරු, ක්‍රීඩා පිටි, ජලාශ සහ තේ වතු වැනි එළිමහනේ ගැවසීමෙන් වලකින්න**
**2. විශාල ගස් යට රැදී සිටීමෙන් වලකින්න**
**3. විදුලි උපකරණ ක්‍රියාත්මක කිරීමෙන් වලකින්න**
**4. රැහැන් දුරකථන භාවිතයෙන් වලකින්න**
**5. හැකි ඉක්මනින් සංවෘත ගොඩනැගිල්ලක් තුල හෝ සංවෘත වාහනයක් තුලට යා යුතුය. එසේ කිරීමට හැකියාවක් නොමැති නම් පහත් වී එනම් තමාගේ උස අඩුකරගෙන කකුල් දෙකත් එක ලඟට රැගෙන (උක්කුටියෙන් ) සිටීම කල යුතුය**

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
2018-10-03